රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය
பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு
Ministry of Public Administration, Provincial Councils and Local Government

ඒකාබද්ධ සේවා අංශය | இணைந்த சேவைகள் பிரிவு | Combined Services Division
නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව. | சுதந்திரச் சதுக்கம், கொழும்பு 07, இலங்கை. | Independence Square, Colombo 07, Sri Lanka

දුරකතනය / தொலைபேசி: 011- 2696211-13 Telephone
ෆැක්ස් / தொலைநகல்: 011- 2695279 Fax
ඊ- මේල් / மின்னஞ்சல்: info@pubad.gov.lk E-mail
වෙබ් අඩවිය / இணையத்தளம்: www.pubad.gov.lk Web Site

මගේ අංකය / எனது இல / My No: CS/ICTS/02/MA-5/6/පොදු II
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 2025.01.30

අමාත්‍යාංශ ලේකම්වරු

කොමිෂන් සභා ලේකම්වරු

දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**<u>ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ (තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ) තනතුරට පත්කිරීම සඳහා වන අයදුම්පත් කැඳවීමේ නිවේදනය</u>**

**<u>ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව</u>**

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් 2025.01.15 දිනැතිව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝග පරිදි පළ කළ උක්ත නිවේදනය මෙහි පහත පළ කරනු ලැබේ.

02. එම නිවේදනයේ අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය 2025.02.14 දක්වා දීර්ඝ කරන අතර නිවේදනයේ සඳහන් අනෙකුත් කොන්දේසි නොවෙනස්ව පවතින බව වැඩිදුරටත් දන්වා සිටිමි

එන්.යූ. නිෂාන් මෙන්ඩිස්

ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්

ඇමුණුම 01

රාජ්‍ය සේවා කොමිෂන් සභාව

**ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව**

**ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ (තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ) තනතුරට පත්කිරීම සඳහා වන අයදුම්පත් කැඳවීමේ නිවේදනය**

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ **නියෝජ්‍ය අධ්‍යක්ෂ (තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ)** තනතුරේ පුරප්පාඩු **03** ක් පවතින අතර, එම පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම්ලත් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ **1 පන්තියේ I ශ්‍රේණියේ හෝ II ශ්‍රේණියේ** නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි 2019.09.12 දිනැතිව නිකුත් කරනු ලැබූ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 28/2019 හි ඇමුණුම 02 අනුව සකස් කරනු ලැබූ අයදුම්පත්‍රයක් **2025.01.31** දින හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත ලැබීමට සැලැස්විය යුතුය. අයදුම්පත යොමු කරන ලිපි කවරයෙහි වම් පස ඉහළ කෙළවරෙහි **"ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ"** තනතුර සඳහා ඉල්ලුම්පත ලෙස සඳහන් කළ යුතුය.

**අයදුම්පත් එවිය යුතු ලිපිනය**
**ජනලේඛන හා සංඛ්‍යාලේඛන අධ්‍යක්ෂ ජනරාල්,**
**අංක 306/71,**
**පොල්දූව පාර,**
**බත්තරමුල්ල.**

03 . ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2050/43 හා හා 2017.12.22 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශයට පත්කරන ලද ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවා ව්‍යවස්ථාවට අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතාවය අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නියෝජ්‍ය අධ්‍යක්ෂ (තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ) තනතුරට පත්කරනු ලැබේ.

**I .සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබාදීමේ පිළිවෙල පහත දක්වා ඇත.**

**ලකුණු පටිපාටිය**

| | පරීක්ෂා කර ලකුණු ලබාදෙන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 01 | **සේවා පළපුරුද්ද - 60** | |
| | I. තනතුරට අදාළ ශ්‍රේණියේ සක්‍රිය හා සතුටුදායක සේවා කාලය වසරක් සඳහා ලකුණු 05 ක්ද වසරකට අඩු මාස 06 කට වඩා වැඩි කාල සීමාවක් සඳහා ලකුණු 02 ½ ක්ද ලබා දෙනු ලැබේ. මාස 06 කට අඩු සේවා කාලයක් සඳහා ලකුණු ලබා දෙනු නොලැබේ. | 50 |
| | II. ආයතනයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අවශ්‍යතාවයට (නියොජ්‍ය/ සහකාර අධ්‍යක්ෂ ලෙස) අදාළ පූර්ව පළපුරුද්ද (උපරිම වසර 05ක් සඳහා) වෙනුවෙන් වසරකට ලකුණු 02 බැගින් ද මාස 06 කට වඩා වැඩි කාල සීමාවක් සඳහා ලකුණු 01 බැගින් ද ලබා දෙනු ලැබේ. මාස 06 කට අඩු සේවා කාලයක් සඳහා ලකුණු ලබා දෙනු නොලැබේ. | 10 |
| .02. | **කුසලතාවය - 40**<br>**I.** අධ්‍යාපන සුදුසුකම්<br>නිලධාරීන් සේවයට බඳවා ගැනීමේ දී සලකා බලනු ලැබූ මූලික සුදුසුකම්වලට අමතරව ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවා ව්‍යවස්ථාවේ විශේෂඥතා ක්ෂේත්‍ර වර්ගීකරණයකට අදාළ හෝ අයදුම්පත් කැඳවා ඇති තනතුරට අදාළ වූ අධ්‍යාපන සුදුසුකම් පමණක් සැලකීමට ලක්කරනු ලැබේ.<br>අ.) පශ්චාත් උපාධිය - ලකුණු 15<br>ආ.) පශ්චාත් උපාධි ඩිප්ලෝමා - ලකුණු 10<br>• ලබා ඇති ඉහළම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ. | 15 |

**II. වෘත්තීය සුදුසුකම්**

**(අ) i.** තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ක්ෂේත්‍රයට අදාළව ලබා ඇති අවම වශයෙන් වසරක් හෝ ඊට වැඩි කාලයක් සහිත ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා - **ලකුණු 10** (දේශීය / විදේශීය) **10**

**ii.** එම ක්ෂේත්‍රයේ මාස 06 ක් හෝ ඊට වැඩි වසරකට අඩු පාඨමාලා සඳහා **-ලකුණු 05**

**(ආ)** ආයතනය විසින් තීරණය කරන තනතුරට අදාළ ක්ෂේත්‍රයේ සම්පූර්ණ කරන ලද අන්තර්ජාතිකව පිළිගත් වෘත්තීය සහතික (Professional Certifications ) සඳහා කාලසීමාව නොසලකා ඉහත **2 (II ) (අ) (i)** යටතේ සැලකීමට ලක් කෙරේ.

උදා: 1) BCS/ACS

2) Microsoft Certifications

- I.Azure Database Administrator
- II.Azure Network Engineer
- III.Windows Server Hybrid Administrator

} Associate Level or Above

3) Sun Certifications

4) Cisco Certifications

- I.CCNP Enterprise Certification
- II.CCNA Certification

} Associate Level or Above

5) CISSP Certifications

**III. විශේෂ කාර්යයන් / දායකත්වයන්** **10**

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ක්ෂේත්‍රයට අදාළව සිදුකරන ලද නව නිර්මාණ, වැඩිදියුණු කිරීම හා ජයග්‍රහණ, ත්‍යාග, ප්‍රශංසා සඳහා මෙ යටතේ ලකුණු ලබා දෙනු ලැබේ.

(අ) නව නිර්මාණ, වැඩිදියුණු කිරීම් , ජයග්‍රහණ හෝ ත්‍යාග සඳහා එකකට ලකුණු 02 බැගින් උපරිම අංග 05ක් සඳහා - **ලකුණු 10**

**(ආ) පොදු 230b ආකෘතියෙන් ඉදිරිපත් කර ඇති අමාත්‍යාංශ ලේකම්/ ආයතන ප්‍රධානියා විසින් සහතික කළ ප්‍රශංසා 01 ක් සඳහා ලකුණු 01 බැගින් උපරිම ප්‍රශංසා 05 ක් සඳහා පමණක් එනම්, උපරිම ලකුණු 05ක් පමණක් ලබා දෙනු ලැබේ.**

**ඉහත III (අ) යටතේ දක්වා ඇති සුදුසුකම් සඳහා උදාහරණ:**

1) මෘදුකාංග නිර්මාණය/ සංවර්ධනය (Software Designing / Development)

2) ජාල පරිපාලනය (Network Administration)

3) පද්ධති පරිපාලනය (System Administration)

4) දත්ත පාදම පරිපාලනය (Data Base Administration)

5) සාමාන්‍ය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කටයුතු සහ වෙනත් (General ICT Tasks & etc.)

- **මෙම කොටස සඳහා (අ) හා (ආ) කාණ්ඩ දෙක යටතේම ලබාගත හැකි උපරිම ලකුණු සංඛ්‍යාව ලකුණු 10කි.**

| | | |
|---|---|---|
| | සැ.යු.<br>❖ නව නිර්මාණ. වැඩි දියුණු කිරීම අයදුම්කරු විසින්ම සිදු කළ බවට ආයතන ප්‍රධානියා විසින් සහතික කර තිබිය යුතුය.<br>❖ ත්‍යාග හා ජයග්‍රහණ අයදුම්කරු විසින් ලබාගත් බවට විධිමත් සහතික පත්‍ර ඉදිරිපත් කළ යුතුය.<br><br>**IV. සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාවය**<br>ඇ.) නායකත්වය - ලකුණු 02<br>ආ.) සන්නිවේදන කුසලතාවය - ලකුණු 02<br>ඇ.) වෘත්තිය ආචාරශීලිභාවය - ලකුණු 01 | 05 |

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි ,

දිනය: 2025.01.15

ඩී.ඩී.පී.ඒ. සෙනෙවිරත්න
අධ්‍යක්ෂ ජනරාල්
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
'සංඛ්‍යාන මන්දිරය'
අංක 306/71 පොල්දූව පාර, බත්තරමුල්ල

ජනලේඛන හා සංඛ්‍යාලේඛන අධ්‍යක්ෂ ජනරාල්


ලිපිනය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
අංක 306/71,
පොල්දූව පාර,
බත්තරමුල්ල.

දුරකථන අංකය - 011 - 2147001
ෆැක්ස් අංකය - 011 - 2147011
ඊ මේල් ලිපිනය - anoja@statistics.gov.lk

ඇමුණුම 02

**ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව**

**ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ (තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ) තනතුරට පත්කිරීම සඳහා වන අයදුම්පත්‍රය**

**(අ) කොටස - නිලධාරියා විසින් සම්පූර්ණ කළ යුතුය.**

1. සම්පූර්ණ නම .............................................................................................. මයා / මිය / මෙය
2. උපන් දිනය ..............................................................................................
3. ජාතික හැඳුනුම්පත් අංකය ..............................................................................................
4. සේවා කාලය

| පන්තිය /ශ්‍රේණිය | සේවා කාලය |
|---|---|
| 1 පන්තිය I ශ්‍රේණිය | |
| 1 පන්තිය II ශ්‍රේණිය | |
| 1 පන්තිය III ශ්‍රේණිය | |

5. දැනට සේවයේ නියුක්ත තනතුර හා කාර්ය ක්ෂේත්‍රය ..............................................................................
6. අධ්‍යාපන සුදුසුකම්

- ලබා ඇති පශ්චාත් උපාධි / පශ්චාත් උපාධි ඩිප්ලෝමා පිළිබඳ විස්තර

| පශ්චාත් උපාධිය/ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව | වර්ෂය | විශ්ව විද්‍යාලය | විෂයයන් |
|---|---|---|---|
| | | | |

7. වෘත්තිය සුදුසුකම් ..............................................................................................
8. සම්පූර්ණ කරන ලද විශේෂ කාර්යයන්

| ඉටු කරන ලද සේවය හා විශේෂ කාර්යය / දායකත්වයන් / ජයග්‍රහණයන් | විස්තරය | ආයතන ප්‍රධානියාගේ සහතිකය ඇත/ නැත |
|---|---|---|
| | | |

ඉහත සඳහන් තොරතුරු සත්‍ය බව ප්‍රකාශ කරමි.

දිනය ........................................ ..................................................................

අයදුම්කරුගේ අත්සන,

තනතුරු නාමය හා නිලමුද්‍රාව

**(ආ) කොටස - ආයතන ප්‍රධානියා විසින් සම්පූර්ණ කළ යුතුය.**

I. නිලධාරියා අයදුම්පත් කැඳවන දිනට පූර්වාසන්න වසර 03 ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සපුරා ඇත. / නැත

II. නිලධාරියා අයදුම්පත් කැඳවන දිනට පූර්වාසන්න වසර 03 තුළ වැටුප් වර්ධක උපයා ගෙන ඇත. / නැත

III. නිලධාරියා අයදුම්පත් කැඳවන දිනට පූර්වාසන්න වසර 03 තුළ කිසිදු විනය දඬුවමකට ලක්වී විරුද්ධව ඇත. / නැත

IV. නිලධාරියාට එරෙහිව විනය කටයුතු ආරම්භ කිරීමට කටයුතු කරමින් හෝ විනය පරීක්ෂණ සිදුවෙමින් පවතී / නොපවතී.

V. පූර්වාසන්න වසර 03 තුළ ලබා ඇති නිවාඩු තොරතුරු

| අනු අංකය | වර්ෂය | වැටුප් සහිත නිවාඩු | අඩ වැටුප් සහිත නිවාඩු | වැටුප් රහිත නිවාඩු |
|---|---|---|---|---|
| | | | | |

ඉහත සඳහන් තොරතුරු නිලධාරියාගේ පුද්ගලික ලිපිගොනුව අනුව නිවැරදි වන බවත් මෙම නිලධාරියා විසින් අයදුම් කරනු ලබන තනතුර සඳහා නිලධාරියා තෝරා ගතහොත් ඒ සඳහා ඔහු / ඇය අනුප්‍රාප්තිකයෙකු රහිතව / සහිතව / අනුප්‍රාප්තිකයෙකු පසුව ලබාදීමේ පදනම මත මුදා හැරිය හැකි බවත් කාරුණිකව දන්වමි.

දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානියාගේ අත්සන,

තනතුරු නාමය හා නිල මුද්‍රාව